අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

**කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව**
தொழில்நுட்பக் கல்வி மற்றும் பயிற்சித் திணைக்களம்
Department of Technical Education & Training

DTET SRI LANKA

*Pioneer Organization in Providing Technical Education and Training in Sri Lanka*

තැ.පෙ.557, ඕල්කට් මාවත, කොළඹ 10. த.பெ. 557, ஒல்கொட் மாவத்தை, கொழும்பு 10. P.O. Box 557, Olcott Mawatha, Colombo 10.

ඔබේ අංකය : / உமது இல : / Your No :
මගේ අංකය : / எமது இல : / My No : DTET/04/02/07/Q & C /G
දිනය: / திகதி: / Date : 2024.03.20

සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
සියලුම තාක්ෂණ, කාර්මික විද්‍යාල,
අධ්‍යක්ෂ, විදුහල්පති

**කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් සංචාරක බංගලා වෙන් කර ගැනීමේ ගාස්තු සංශෝධනය කිරීම.**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ වෙත යොමු කර ඇති මාගේ සමාංක හා 2023.09.14 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව මහනුවර සංචාරක බංගලාවේ අය කරනු ලබන ගාස්තු ද ඇමුණුම 01 මඟින් සඳහන් කර ඇති ආකාරයට **2024.04.01** දින සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කරන බව කාරුණිකව දන්වා සිටිමි. (නමුත් අනුරාධපුර සහ අම්පාර යන සංචාරක බංගලාවන් වෙන් කිරීමේ ගාස්තු වල කිසිදු සංශෝධනයක් සිදු නොවන බවද දන්වා සිටිමි).

03. තවද සංචාරක බංගලා වෙන් කිරීමේ අයදුම්පත්‍රයද සංශෝධනය කර ඇති අතර, එම සංශෝධිත අයදුම්පත්‍රයද මෙම ලිපිය සමඟ ඔබ වෙත යොමු කර කරන බව දන්වා සිටින අතර, ඒ අනුව සංචාරක බංගලා වෙන් කිරීමට අපේක්ෂිත සියලුම නිලධාරීන් එම සංශෝධිත අයදුම්පත්‍රය පමණක් මින් ඉදිරියට නිවැරදිව සම්පූර්ණ කොට මා වෙත යොමු කිරීමට කටයුතු කළ යුතු බවද දන්වා සිටිමි.

04. ඒ අනුව මෙම නිවේදනය දෙපාර්තමේන්තුවේ සේවය කරන සියලුම නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කළ යුතු බවද මෙයින් දන්වා සිටිමි.

එස්.සී.ජගත්
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :

01. ප්‍රධාන ගණකාධිකාරී - **2024.04.01** දින සිට ක්‍රියාත්මක වන පරිදි මහනුවර සංචාරක බංගලාවේ අය කර ගනු ලබන ගාස්තු ඇමුණුම **01** අනුව සංශෝධනය කර ඇති බව දන්වා සිටිමි.

02. සහකාර අධ්‍යක්ෂ, තොරතුරු කළමනාකරණ ඒකකය - මහනුවර සංචාරක බංගලාවේ අය කරනු ලබන ගාස්තු ඇමුණුම 01 දක්වා ඇති ආකාරයට දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ යාවත්කාලීන කිරීමට කටයුතු කරන්න.

03. අධ්‍යක්ෂ, තාක්ෂණ විද්‍යාලය, මහනුවර - මෙම සංශෝධනයන් අනුව මහනුවර සංචාරක බංගලාවේ ගාස්තු අය කිරීම සඳහා කටයුතු කරන්න.

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General: 011-3137290, 011-2431288, 011-2449136(Fax)
කාර්යාලය / அலுவலகம் / Office: 011-2348896, 011-2348897, 011-2439078
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2439077
E-mail:- info@dtet.gov.lk
Website - www.dtet.gov.lk
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන හා මූල්‍ය) / மேலதிக பணிப்பாளர் நாயகம் (நிர்வாகம்/நிதி): 011-2348895
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (කාර්මික අධ්‍යාපන) / மேலதிக பணிப்பாளர் நாயகம் (தொழில்நுட்பக் கல்வி): 011-2437103, [illegible]

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
තැ.පෙ 557, ඕල්කට් මාවත, කොළඹ 10
011 2 348 890

**කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ සංචාරක බංගලා වෙන් කර ගන්නා ආකාරය**

- මෙම සංචාරක බංගලාව වෙන්කිරීමේ වරප්‍රසාදය හිමිව ඇත්තේ රාජ්‍ය අංශයේ / හා විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන්ට, පමණක් බව කාරුණිකව සලකන්න.
- සංචාරක බංගලා වෙන් කර ගැනීම සඳහා මේ සමඟ දක්වා ඇති අයදුම්පත්‍රය නිසි පරිදි සම්පූර්ණ කර,කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, තුන්වන මහල, තැ.පෙ.557, කොළඹ - 10 වෙත පැමිණෙන්න.
- ඔබට සංචාර බංගලා වෙන් කර ගැනීමට හැකි වන්නේ ඔබ අයදුම්පත්‍රය ඉදිරිපත් කරන දින සිට දින **30**ක් ඉදිරියෙන් ඇති (මාසයක් ඉදිරියෙන්) දිනක් සඳහා පමණි.
- විමසීම් දුරකතන අංක - **011 2 348 890**

සංචාරක බංගලා භාවිතයේදී පිළිපැදිය යුතු කොන්දේසි

සංචාරක බංගලාවේ නවාතැන් ගනු ලබන ඔබ පහත සඳහන් කරුණු පිළිබඳව ප්‍රමුඛතාවයක්, සැලකිල්ලක් දක්වනු ඇතැයි අපගේ බලාපොරොත්තුවයි.

1. සංචාරක බංගලාවේ නේවාසික පහසුකම් සපයනු ලබන්නේ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ හා නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන්ට සහ සේවක මහතුන්ට පමණි.
   - ඉහත නිලධාරීන් හෝ සේවක මහතුන් සංචාරක බංගලා වෙන්කර නොමැති අවස්ථා වලදී පිටස්තර අය සඳහා ද මෙම පහසුකම් ලබාදෙනු ලැබේ
   - අදාල අයදුම්කරුවන්ගේ ජාතික හැඳුනුම්පත පරීක්ෂා කර බලා අනන්‍යතාව පිළිබඳ සෑහීමකට පත්වන්නේ නම් පමණක් සංචාරක බංගලා භාරකරු විසින් අවසර පත්‍රයේ නම් සඳහන් අයට පමණක් නේවාසික පහසුකම් ලබා දීමට කටයුතු කරනු ලැබේ.
   - නවාතැන් ගන්නා අයගේ අනන්‍යතාවය පිළිබඳව අයදුම්කරු සෑහීමකට පත්විය යුතු අතර, නවාතැන් ගන්නා කාල වකවානුව තුළදී ඒ සම්බන්ධයෙන් වන සියලු වගකීම් අයදුම්කරු විසින් දැරිය යුතුය.

2. ඉහත 01 යටතේ ගැනෙන අය සඳහා නවාතැන් පහසුකම් ලබා ගැනීමට අවශ්‍ය නම් ඒ සඳහා අයදුම්පත් ඉදිරිපත් කර කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගත යුතුය.

   - මෙම දෙපාර්තමේන්තුවේ රාජකාරි අවශ්‍යතාවයකදී කෙටි දැනුම්දීමකින් මෙම වෙන් කිරීම අවලංගු කිරීමේ පදනම මත සංචාරක බංගලාව වෙන්කරනු ලැබේ. එවැනි අවස්ථාවක දී ගෙවන ලද මුදල ආපසු ගෙවනු ලැබේ. කෙසේ වුවද තමන් විසින් වෙන්කර ගැනීම අවලංගු කරගත හොත් එම මුදල් ආපසු ගෙවනු නොලැබේ.

3. ඉහත 1 යටතේ නිවාඩු ගත කිරීම සඳහා පහත සඳහන් අයුරින් ගාස්තු අයකරනු ලැබේ. (ඇමුණුම 02 බලන්න) මෙම මුදල් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව වෙත පැමිණ ගෙවා එම ලදුපතද රැගෙන සංචාරක බංගලාව වෙත යා යුතු වේ.

4. එසේත් නොමැති නම් අධ්‍යක්ෂ ජනරාල් නමින් වූ මහජන බැංකුවේ නගර මධ්‍ය ශාකාවේ ගිණුම් අංක 176-1-001-3-9026228 බැර කොට අදාල ලදුපත සංචාරක බංගලා භාරකරු වෙත ලබා දිය යුතුය.

තවද, අයදුම්කරු සංචාරක නිවාසයේ අනිවාර්යයෙන් නවාතැන් ගැනීම සිදුකළ යුතු අතර සංචාරක නිවාසයේ නවාතැන් ගැනීමේදී රාජකාරී හැඳුනුම්පත, දෙපාර්තමේන්තුව/ අනුමත කරන ලද අයදුම් පතේ පිටපතක් හා මුදල් ගෙවන ලද කුවිතාන්සියේ මුල් පිටපත බංගලා භාරකරු වෙත අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පතෙහි සඳහන් නොමැති පුද්ගලයන් සඳහා නවාතැන් පහසුකම් නොසපයන ලෙස සංචාරක නිවාස භාරකරුවන් දැනුවත් කර ඇති බැවින් අයදුම්පතෙහි නම සඳහන්ව නොමැති කිසිදු පුද්ගලයකු සංචාරක නිවාසයේ නවාතැන් ගැනීමට රැගෙන නොයා යුතුය. - සැ.යු - අයදුම්කරු නොමැතිව නවාතැන් ගැනීම සඳහා පැමිණෙන පිරිස ආපසු හරවා යැවීමට සිදු වන බව කරුණාවෙන් සලකන්න.

5. කාමර වෙන් කරවා ගැනීම සඳහා අවම වශයෙන් සති 02 කට කලින් ඉල්ලුම් කල යුතුය.

6. සංචාරක බංගලාවේ නවාතැන් ගන්නා එක් දිනක් වශයෙන් සැලකෙනුයේ පෙරදා ප.ව.1.00 සිට පසුදා දහවල් 12.00 දක්වා වන අතර අදාල කාල සීමාව පසු වූ විට ඉවත් විය යුතුය.

7. සංචාරක බංගලාවේ නවාතැන් ගැනීම සඳහා අවසර දෙනු ලබන අයට හැර එම සංඛ්‍යාවට පිටස්තර කිසිවෙකුට නවාතැන් පහසුකම් දෙනු නොලැබේ.එසේම නවාතැන් ලබාගැනීමට ඉල්ලුම් කළ අයදුම්පතෙහි නම් සඳහන් ව ඇති අය හැර වෙනත් අය කැඳවාගෙන යාම සම්පූර්ණයෙන් තහනම්වේ.මෙවැනි අවස්ථාවල අදාල සම්පූර්ණ වෙන් කිරීම වුව ද අවලංගු කිරීමට සිදුවනු ඇත.අයදුම්කරුගේ හේතුවක් මත වෙන්කරගත් සංචාරක බංගලාවක් භාවිතා කිරීමට නොහැකිවීම මත ඒ වෙනුවෙන් ගෙවන ලද මුදල් ආපසු ගෙවීමක් හෝ වෙනත් දිනයක් ලබාදීම සිදුකරනු නොලැබේ.
වෙන්කරගත් අයදුම් පත්‍රය කිසිදු හේතුවක් නිසා හෝ වෙනත් අයදුම්කරුවෙකු වෙත පැවරීමට ඉඩ දෙනු නොලැබේ.

8. නවාතැන් පහසුකම් සපයනු ලබන්නේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අවසර පත්‍රයේ සඳහන් දිනයට පමණි.

9. මෙම අවසරපත්‍රය අන්සතු කිරීම සම්පූර්ණයෙන් තහනම් වේ.එසේ අන්සතු කිරීම හෝ ඔබ සංචාරක නිවාසයේ ගත කරන කාලය තුල ඔබට විරුද්ධව යම් පැමිණිල්ලක් ලැබුණහොත් හෝ අයදුම්කරුට එරෙහිව විනයානුකූලව ක්‍රියාකරනු ලැබේ.

10. සංචාරක බංගලාවේ කාමර කුලියට අමතරව නවාතැන් ගන්නා අය වෙනුවෙන් සපයනු ලබන ඇඳ ඇතිරිලි සහ කොට්ට උර ආදිය සඳහා පහත පරිදි ගාස්තු ගෙවිය යුතු වේ. එම ගෙවීම් වෙනුවෙන් අදාල බංගලා භාරකරු වෙතින් මුදල් ලබා ගත් බවට ලදුපතක් ලබාගන්න.

| | |
|---|---|
| කුඩා ඇඳ ඇතිරිලි | රු. 100.00 |
| ද්විත්ව ඇඳ ඇතිරිලි | රු. 150.00 |
| කොට්ට උර | රු. 50.00 |
| පොරවන | රු. 100.00 |
| තුවා | රු. 75.00 |

<u>ඇඳ ඇතිරිලි තුවා ආදිය සඳහා මිල ගණන් (වෙනස් වීමට ඉඩ ඇත)</u>

**නිවේදනය:- අදාළ රෙදිපිළි ඉතා යහපත් හා පිරිසිදු මට්ටමෙන් ලබා දීමට බංගලා භාරකරු බැඳී සිටී. ඒවා භාවිතා කළ නොහැකි අපිරිසිදු මට්ටමින් පවතී නම් ඒ බව භාවිතා කිරීමට ප්‍රථම බංගලා භාරකරුට දැන්වීම හා යහපත් ඒවා ලබා ගැනීම ඔබගේ ද වගකීමකි.**

11. ආහාර පාන සැකසීම සඳහා වියදම් බංගලා භාරකරු විසින් වෙනම අයකරනු ලැබේ.(ගෑස් සඳහා වේලකට රු.500.00 කි) සංචාරක නිවාසයෙන් බැහැර වීමට ප්‍රථම සියළු මුදල් ගෙවා නිරවුල් කළ යුතුය.

12. සංචාරක බංගලාවේ ඇති රූපවාහිනිය, ගුවන්විදුලි යන්ත්‍රය, දුරකථනය හා අනෙකුත් භාණ්ඩ බංගලා භාරකරුගේ අවසරයකින් තොරව පරිහරණය කිරීම සම්පූර්ණයෙන් තහනම් වේ.

13. සංචාරක බංගලා පරිහරණය කිරීමේදී එහි ඇති භාණ්ඩ වලට අලාභ හානි සිදු වුවහොත් එකී වටිනාකම අයදුම්කරුගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

14. මෙම බංගලාවේ උත්සව හෝ සම්භාෂණ පැවැත්වීම හා මත්පැන්,දුම්වැටි භාවිතා කිරිම සම්පූර්ණයෙන්ම තහනම් වේ.

15. ඔබ සංචාරක නිවාසයේ ගත කරන කාලය තුළ කරන ලද ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔබට විරුද්ධව යම් පැමිණිල්ලක් ලැබුණහොත් ඉදිරියේදී මෙම දෙපාර්තමේන්තුවේ සංචාරක නිවාස වෙන් කිරීම පිළිබඳ ඔබේ හා පවුලේ අයගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

16. නවාතැන් පහසුකම් පිළිබඳ පැමිණිලි ඇතහොත් දෙපාර්තමේන්තුව වෙත පහත සඳහන් දුරකථන අංක මඟින් දැන්විය හැක.
කාර්යාලය - 011 2348898  011 3137290

මෙම බංගලාවේ උත්සව හෝ සම්භාෂණ පැවැත්වීම හා මත්පැන්,දුම්වැටි භාවිතා කිරීම සම්පූර්ණයෙන්ම තහනම් වේ.

- ඔබ සංචාරක නිවාසයේ ගත කරන කාලය තුළ කරන ලද ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔබට විරුද්ධව යම් පැමිණිල්ලක් ලැබුණහොත් ඉදිරියේදී මෙම දෙපාර්තමේන්තුවේ සංචාරක නිවාස වෙන් කිරීම පිළිබඳ ඔබේ හා පවුලේ අයගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

සංචාරක බංගලා වෙන් කර ගැනීමේ අයදුම්පත / නව කාමර ගාස්තු / බංගලා භාරකරුවන්ගේ ඇමතුම් තොරතුරු

- සංචාරක බංගලා වෙන් කර ගැනීමේ අයදුම්පත

අයදුම්පත බාගත කරගන්න

- සංචාරක බංගලාවල නව කාමර ගාස්තු

කාමර ගාස්තු සටහන බාගත කරගන්න

- සංචාරක බංගලා භාරකරුවන්ගේ ඇමතුම් විස්තර

ඇමතුම් විස්තර බාගත කරගන්න.

ඔබ හා ඔබගේ කණ්ඩායම බංගලා භාරකරුගෙන් ආහාර පාන මිල දී ගන්නේ නම්, ඔහුගේ ආහාර පාන වට්ටෝරුවෙන් අදාළ ආහාර පාන අවශ්‍යතාවයට පැය 03කට කලින්වත් ඇණවුම්කර ලබාගත යුතු වේ. අදාළ බංගලාවලින් ලබාගත හැකි ආහාර පාන විස්තරයක් පහත දැක්වේ. මෙය සාමාන්‍ය ආහාර පාන වට්ටෝරුවක් වන අතර වෙළඳපොළ පවතින පහසුකම් යටතේ ලබා ගත හැකි ආහාර හා මිල ගණන් වෙනස් විය හැක. ඔබගේ අවශ්‍යතාවය පරිදි බංගලා භාරකරු මඟින් ආහාර සකස් කර ගත හැකි අතර මිල ගණන් කලින් සාකච්ඡා කර ගැනීම යෝග්‍ය වේ.

ආහාර පාන සකස් කර ගැනීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සපයා දීමෙන් හා ඒ සඳහා යන වියදම් ගෙවීමෙන් ද ඔබගේ ආහාර පාන අවශ්‍යතාවය ඉටු කර ගත හැක.

| ආහාර වේල | සැපයිය හැකි සාමාන්‍ය ආහාර වර්ග |
|---|---|
| උදෑසන ආහාර | • කිරිබත්(කෑලි 03)/ කට්ට සම්බෝල<br>• කිරිබත්(කෑලි 03)/ කට්ට සම්බෝල/ තක්කාලි හොදි<br>• කිරිබත්(කෑලි 03)/ කට්ට සම්බෝල/ තක්කාලි හොදි/ මාළු(බල/කෙලවල්ලා/සැමන්)<br>• ඉඳි ආප්ප(15)/ පොල් සම්බෝල/ පරිප්පු හෝ අල කරිය<br>• ඉඳි ආප්ප(15)/ පොල් සම්බෝල/ පරිප්පු හෝ අල කරිය/ බිත්තර කරිය<br>• බත් / පොල් සම්බෝල / පරිප්පු<br>• බත් / පොල් සම්බෝල / පරිප්පු හෝ අල කරිය/ හාල් මැස්සන් (තෙම්පරාදු)<br>• බත් / පොල් සම්බෝල / පරිප්පු හෝ අල කරිය/ බිත්තර කරිය<br>• පාන්(1/2) / පොල් සම්බෝල / පරිප්පු හෝ අල කරිය |

| | |
|---|---|
| දිවා / රාත්‍රී ආහාර | • බත්/ පරිප්පු/ එළවළු වර්ග 1/කොළ මැල්ලුම/ එළවළු සලාද/ පපඩම්<br>• බත්/ පරිප්පු/ එළවළු වර්ග 1/කොළ මැල්ලුම/ එළවළු සලාද/ පපඩම්/ මාළු කරිය<br>• බත්/ පරිප්පු/ එළවළු වර්ග 1/කොළ මැල්ලුම/ එළවළු සලාද/ පපඩම්/කුකුළු මස් කරිය<br>• ෆ්‍රයිඩ් රයිස්(සම්බා හාල්)/පරිප්පු හෝ අල කරිය/ චිලි පේස්ට්<br>• ෆ්‍රයිඩ් රයිස්(සම්බා හාල්)/පරිප්පු හෝ අල කරිය/ චිලි පේස්ට්/ මාළු ඩෙවල්<br>• ෆ්‍රයිඩ් රයිස්(සම්බා හාල්)/පරිප්පු හෝ අල කරිය/ චිලි පේස්ට්/ කුකුළු මස් ඩෙවල්<br>• ෆ්‍රයිඩ් රයිස්(සම්බා හාල්)/කුකුළු මස් කරිය/ චොප්සි/ චිලි පේස්ට්<br>• ෆ්‍රයිඩ් රයිස්(සම්බා හාල්)/කුකුළු මස් ඩෙවල් / චොප්සි/ චිලි පේස්ට්<br>• බිත්තර ෆ්‍රයිඩ් රයිස්/ පරිප්පු හෝ අල කරිය/ චිලි පේස්ට්<br>• කුකුළු මස් ෆ්‍රයිඩ් රයිස්/ චිලි පේස්ට්/ සෝස් |
| රාත්‍රී ආහාරය | • ඉදි ආප්ප(15)/ පොල් සම්බෝල/ පරිප්පු හෝ අල කරිය<br>• ඉදි ආප්ප(15)/ පොල් සම්බෝල/ පරිප්පු හෝ අල කරිය/ බිත්තර කරිය<br>• එළවළු සමග නූඩ්ල්ස්/ පරිප්පු හෝ අල කරිය/ චිලි පේස්ට්<br>• එළවළු සමග නූඩ්ල්ස්/ පරිප්පු හෝ අල කරිය/ කුකුළු මස් කරිය<br>• එළවළු සමග නූඩ්ල්ස්/ පරිප්පු හෝ අල කරිය/ කුකුළු මස් කරිය/ චිලි පේස්ට්<br>• එළවළු සමග නූඩ්ල්ස්/ පරිප්පු හෝ අල කරිය/ මාළු කරිය/ චිලි පේස්ට් |
| තේ | • තේ<br>• කිරි තේ/ කිරි කෝපි<br>• මයිලෝ/ නෙස්ටමෝල්ට් |
| අතුරුපස (පාලන මිල/ ලකුණු කළ මිල ) | • මී කිරි / පැණි<br>• අයිස් ක්‍රීම්<br>• යෝගට්<br>• පැණි යෝගට් |

- සංචාරක බංගලාවෙන් ආහාර ලබා ගන්නේ නම් සංචාරක බංගලාවට යාමට පෙර සංචාරක බංගලා භාරකරුට දැනුම් දිය යුතුය.
- නවාතැන් ගන්නා පුද්ගලයින් සංචාරක බංගලාවෙන් ආහාර ලබා ගැනීම වෙනුවට ආහාර පාන සැකසීමට අවශ්‍ය අමු ද්‍රව්‍ය ලබාදෙන අවස්ථාවන්හිදී එක් වේලක් සඳහා ආහාර පිළියෙළ කිරීමට එක් පුද්ගලයෙකුගෙන් රු. **50.00** ක සේවා ගාස්තුවක් අය කරනු ලැබේ.
- වෙනත් අමතර ආහාර වර්ග ඇනවුම් කරන්නේ නම් ඒ සඳහා අමතර ගාස්තුවක් ගෙවීමට සිදුවනු ඇත.

# අනුරාධපුර සංචාරක බංගලා සඳහා අයකිරීම.

| සංචාරක බංගලාව | මුළු කාමර ගණන | වායුසමීකරණය | | කාමර 01ක් සඳහා අයකිරීම | | | |
|---|---|---|---|---|---|---|---|
| | | සහිත | රහිත | දෙපාර්තමේන්තුව/අමාත්‍යාංශය | | | |
| | | | | රාජකාරි | | පෞද්ගලික | |
| | | | | වායුසමීකරණ සහිත (රු.) | වායුසමීකරණ රහිත (රු.) | වායුසමීකරණ සහිත (රු.) | වායුසමීකරණ රහිත (රු.) |
| අනුරාධපුරය | 03 | 03 | - | 125.00 | - | 500.00 | - |

| සංචාරක බංගලාව | මුළු කාමර ගණන | වායුසමීකරණය | | කාමර 01ක් සඳහා අයකිරීම | | | |
|---|---|---|---|---|---|---|---|
| | | සහිත | රහිත | අමාත්‍යාංශයට අයත් අනෙකුත් ආයතනවල | | | |
| | | | | රාජකාරි | | පෞද්ගලික | |
| | | | | වායුසමීකරණ සහිත (රු.) | වායුසමීකරණ රහිත (රු.) | වායුසමීකරණ සහිත (රු.) | වායුසමීකරණ රහිත (රු.) |
| අනුරාධපුරය | 03 | 03 | - | 150.00 | - | 750.00 | - |

| සංචාරක බංගලාව | මුළු කාමර ගණන | වායුසමීකරණය | | කාමර 01ක් සඳහා අයකිරීම | |
|---|---|---|---|---|---|
| | | සහිත | රහිත | වෙනත් | |
| | | | | | |
| | | | | වායුසමීකරණ සහිත (රු.) | වායුසමීකරණ රහිත (රු.) |
| අනුරාධපුරය | 03 | 03 | - | 1000.00 | - |

❖ නවාතැන් ගත හැකි උපරිම නේවාසිකයන් ගණන - 06

# අම්පාර සංචාරක බංගලා සඳහා අයකිරීම.

| සංචාරක බංගලාව | මුළු කාමර ගණන | වායුසමීකරණය | | කාමර 01ක් සඳහා අයකිරීම | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | දෙපාර්තමේන්තුව/අමාත්‍යාංශය | | | |
| | | සහිත | රහිත | රාජකාරි | | පෞද්ගලික | |
| | | | | වායුසමීකරණ සහිත (රු.) | වායුසමීකරණ රහිත (රු.) | වායුසමීකරණ සහිත (රු.) | වායුසමීකරණ රහිත (රු.) |
| අම්පාර | 03 | 02 | 01 | 125.00 | 75.00 | 500.00 | 250.00 |

| සංචාරක බංගලාව | මුළු කාමර ගණන | වායුසමීකරණය | | කාමර 01ක් සඳහා අයකිරීම | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | අමාත්‍යාංශයට අයත් අනෙකුත් ආයතනවල | | | |
| | | සහිත | රහිත | රාජකාරි | | පෞද්ගලික | |
| | | | | වායුසමීකරණ සහිත (රු.) | වායුසමීකරණ රහිත (රු.) | වායුසමීකරණ සහිත (රු.) | වායුසමීකරණ රහිත (රු.) |
| අම්පාර | 03 | 02 | 01 | 150.00 | 100.00 | 750.00 | 400.00 |

| සංචාරක බංගලාව | මුළු කාමර ගණන | වායුසමීකරණය | | කාමර 01ක් සඳහා අයකිරීම | |
|---|---|---|---|---|---|
| | | | | වෙනත් | |
| | | සහිත | රහිත | | |
| | | | | වායුසමීකරණ සහිත (රු.) | වායුසමීකරණ රහිත (රු.) |
| අම්පාර | 03 | 02 | 01 | 1000.00 | 600.00 |

- ❖ නවාතැන් ගත හැකි උපරිම නේවාසිකයන් ගණන - 06

## වීරවිල සංචාරක බංගලා සඳහා අයකිරීම.

| සංචාරක බංගලාව | මුළු කාමර ගණන | වායුසමීකරණය | | කාමර 01ක් සඳහා අයකිරීම | | | |
|---|---|---|---|---|---|---|---|
| | | සහිත | රහිත | දෙපාර්තමේන්තුව/අමාත්‍යාංශය | | | |
| | | | | රාජකාරි | | පෞද්ගලික | |
| | | | | වායුසමීකරණ සහිත (රු.) | වායුසමීකරණ රහිත (රු.) | වායුසමීකරණ සහිත (රු.) | වායුසමීකරණ රහිත (රු.) |
| වීරවිල | 03 | 02 | 01 | 150.00 | 100.00 | 1000.00 | 500.00 |

| සංචාරක බංගලාව | මුළු කාමර ගණන | වායුසමීකරණය | | කාමර 01ක් සඳහා අයකිරීම | | | |
|---|---|---|---|---|---|---|---|
| | | සහිත | රහිත | අමාත්‍යාංශයට අයත් අනෙකුත් ආයතනවල | | | |
| | | | | රාජකාරි | | පෞද්ගලික | |
| | | | | වායුසමීකරණ සහිත (රු.) | වායුසමීකරණ රහිත (රු.) | වායුසමීකරණ සහිත (රු.) | වායුසමීකරණ රහිත (රු.) |
| වීරවිල | 03 | 02 | 01 | 1000.00 | 500.00 | 1500.00 | 1000.00 |

| සංචාරක බංගලාව | මුළු කාමර ගණන | වායුසමීකරණය | | කාමර 01ක් සඳහා අයකිරීම | |
|---|---|---|---|---|---|
| | | සහිත | රහිත | වෙනත් | |
| | | | | | |
| | | | | වායුසමීකරණ සහිත (රු.) | වායුසමීකරණ රහිත (රු.) |
| වීරවිල | 03 | 02 | 01 | 3000.00 | 2000.00 |

- ❖ නවාතැන් ගත හැකි උපරිම නේවාසිකයන් ගණන - 06

# මොණරාගල සංචාරක බංගලා සඳහා අයකිරීම.

| සංචාරක බංගලාව | මුළු කාමර ගණන | වායුසමීකරණය | | කාමර 3 සඳහා ම අයකිරීම | |
|---|---|---|---|---|---|
| | | | | දෙපාර්තමේන්තුව/අමාත්‍යංශය | |
| | | සහිත | රහිත | රාජකාරි | පෞද්ගලික |
| | | | | වායුසමීකරණ රහිත (රු.) | වායුසමීකරණ රහිත (රු.) |
| මොනරාගල | 03 | | 03 | - | 1000.00 |

❖ නවාතැන් ගත හැකි උපරිම නේවාසිකයන් ගණන - 08

# මහනුවර සංචාරක බංගලා සඳහා අයකිරීම.

| සංචාරක බංගලාව | මුළු කාමර ගණන | වායුසමීකරණය | | කාමර 01ක් සඳහා අයකිරීම | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | දෙපාර්තමේන්තුව/අමාත්‍යාංශය | | | |
| | | සහිත | රහිත | රාජකාරි | | පෞද්ගලික | |
| | | | | වායුසමීකරණ සහිත (රු.) | වායුසමීකරණ රහිත (රු.) | වායුසමීකරණ සහිත (රු.) | වායුසමීකරණ රහිත (රු.) |
| මහනුවර | 03 | 01 | 02 | 150.00 | 100.00 | 1000.00 | 500.00 |

| සංචාරක බංගලාව | මුළු කාමර ගණන | වායුසමීකරණය | | කාමර 01ක් සඳහා අයකිරීම | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | අමාත්‍යාංශයට අයත් අනෙකුත් ආයතනවල | | | |
| | | සහිත | රහිත | රාජකාරි | | පෞද්ගලික | |
| | | | | වායුසමීකරණ සහිත (රු.) | වායුසමීකරණ රහිත (රු.) | වායුසමීකරණ සහිත (රු.) | වායුසමීකරණ රහිත (රු.) |
| මහනුවර | 03 | 01 | 02 | 750.00 | 400.00 | 1500.00 | 1000.00 |

| සංචාරක බංගලාව | මුළු කාමර ගණන | වායුසමීකරණය | | කාමර 01ක් සඳහා අයකිරීම | |
|---|---|---|---|---|---|
| | | | | වෙනත් | |
| | | සහිත | රහිත | | |
| | | | | වායුසමීකරණ සහිත (රු.) | වායුසමීකරණ රහිත (රු.) |
| මහනුවර | 03 | 01 | 02 | 3000.00 | 2000.00 |

❖ නවාතැන් ගත හැකි උපරිම නේවාසිකයන් ගණන - 06

DTET/04/CB - 1

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ සංචාරක බංගලාවල නේවාසික පහසුකම් ලබා ගැනීම සඳහා අයදුම්පත

(මෙම අයදුම්පත ආයතන ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය)

1.අයදුම්කරුගේ නම: ..........................................................................................................

2.තනතුර: ..........................................................................................................

3.සේවය කරන ආයතනය: ..........................................................................................................

4.ආයතනයේ ලිපිනය: ..........................................................................................................

දුරකථන අංකය: ..........................................................................................................

4.පෞද්ගලික ලිපිනය: ..........................................................................................................

දුරකථන අංකය: ..........................................................................................................

5.නේවාසික පහසුකම් අවශ්‍ය දින ගණන: ..........................................................

| | | | |
|---|---|---|---|
| අනුරාධපුර | :..........................................දින | සිට..........................................දක්වා | |
| අම්පාර | :..........................................දින | සිට..........................................දක්වා | |
| වීරවිල | :..........................................දින | සිට..........................................දක්වා | |
| මොණරාගල | :..........................................දින | සිට..........................................දක්වා | |
| මහනුවර | :..........................................දින | සිට..........................................දක්වා | |

6.නේවාසික පහසුකම් ඉල්ලා සිටින්නේ:

I. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අයකු සඳහාද? :ඔව්/නැත

II. අධ්‍යාපන අමාත්‍යාංශයේ හෝ ඒ යටතේ ඇති ආයතනයක අයකු සඳහාද? :ඔව්/නැත

III. රාජකාරී සඳහාද? :ඔව්/නැත

(එසේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ලිපියකින් ඉදිරිපත් කරන්න)

7.සංචාරක බංගලාවෙහි නේවාසික පහසුකම් අවශ්‍ය අයගේ තොරතුරු

| අනු අංකය | නම | වයස | අයදුම්කරුට ඇති ඥාති සම්බන්ධතාවය |
|---|---|---|---|
| 01 | | | |
| 02 | | | |
| 03 | | | |
| 04 | | | |
| 05 | | | |
| 06 | | | |

8.නවාතැන් ගැනීමට අවශ්‍ය පුද්ගලයින් ගණන:...................................

9.ඉල්ලා සිටින කාමර ගණන:........................................................... වායු සමීකරණ සහිතද?: ඔව්/නැත

දිනය: ..............................................

..............................................

අයදුම්කරුගේ අත්සන

---

<u>ආයතන ප්‍රධානියාගේ නිර්දේශය</u>

රාජකාරී සඳහා /විවේක ගත කිරීම සඳහා නේවාසික පහසුකම් ලබා දීම නිර්දේශ කරමි.

දිනය:..............................................

..............................................

ආයතන ප්‍රධානියාගේ අත්සන

---

<u>දෙපාර්තමේන්තුවේ ප්‍රයෝජනය සඳහා</u>

අනුමත කරමි/නොකරමි

දිනය:..............................................

..............................................

අධ්‍යක්ෂ ජනරාල්

**අනුරාධපුර,අම්පාර,මහනුවර,වීරවිල සහ මොණරාගල සංචාරක බංගලා වෙන්කර ගැනීමේදී පහත උපදෙස් පිළිපැදිය යුතුවේ.**

01. සංචාරක බංගලාවේ නේවාසික පහසුකම් සපයනු ලබන්නේ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ සහ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සේවය කරන නිලධාරීන්ට සහ සේවක මහතුන්ට පමණි.

- ඉහත නිලධාරීන්ට හෝ සේවක මහතුන්ට වෙන් කර නොමැති අවස්ථා වලදී අනෙකුත් සියලුම රාජ්‍ය නිලධාරීන් සඳහා ද මෙම පහසුකම් ලබා දෙනු ලැබේ.
- **අදාල අයදුම්කරුවන්ගේ ජාතික හැඳුනුම්පත පරීක්ෂා කර බලා අනන්‍යතාවය පිළිබඳ සෑහීමකට පත්වන්නේ නම් පමණක් සංචාරක බංගලා භාරකරු විසින් අවසර පත්‍රයේ නම් සඳහන් අය හට පමණක් නේවාසික පහසුකම් ලබා දීමට කටයුතු කරනු ලැබේ.**

02. ඉහත 01 යටතේ ගැනෙන අය සඳහා නවාතැන් පහසුකම් ලබාගැනීමට අවශ්‍ය නම් ඒ සඳහා අයදුම්පත් ඉදිරිපත් කර කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගත යුතුය.

- හදිසි අවස්ථාවකදී අමාත්‍යාංශය භාර ගරු අමාත්‍යතුමාගේ ප්‍රයෝජනය සඳහා කලින් වෙන් කරන ලද කාමර අවලංගු කිරීමේ බලය අධ්‍යක්ෂ ජනරාල් වෙත ඇති අතර,එසේ වුවහොත් කලින් ගෙවන ලද මුදල් ආපසු ගෙවීමක් කරනු ලැබේ.කෙසේ වුවද තමන් විසින් වෙන් කර ගැනීම අවලංගු කර ගතහොත් එම මුදල් ආපසු ගෙවනු නොලැබේ.

03. ඉහත 01 යටතේ නිවාඩු ගත කිරීම සඳහා අයකරනු ලබන ගාස්තු කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව වෙත පැමිණ ගෙවා එම ලදුපතද රැගෙන සංචාරක බංගලාව වෙත යා යුතු වේ.

04. කාමර වෙන් කරවා ගැනීම සඳහා අවම වශයෙන් සති 02 කට කලින් ඉල්ලුම් කල යුතු ය.

05. සංචාරක බංගලාවේ නවාතැන් ගන්නා එක් දිනක් වශයෙන් සැලකෙනුයේ පෙරදා ප.ව.1.00 සිට පසුදා දහවල් 12.00 දක්වා කාලය වේ.ඒ අනුව දහවල් 12.00ට පෙර ඉවත් විය යුතුය.

06. සංචාරක බංගලාවේ නවාතැන් ගැනීම සඳහා අවසර දෙනු ලබන අයට හැර එම සංඛ්‍යාවට පිටස්තර කිසිවෙකුට නවාතැන් පහසුකම් දෙනු නොලැබේ.එසේම නවාතැන් ලබා ගැනීමට අවසර ලබාගෙන ඇති අය හැර වෙනත් අය කැඳවා ගෙන යාම සම්පූර්ණයෙන් තහනම් වේ.මෙවැනි අවස්ථාවල අදාල සම්පූර්ණ වෙන් කිරීම වුවද අවලංගු කිරීමට සිදුවනු ඇත.

07. නවාතැන් පහසුකම් සපයනු ලබන්නේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අවසර පත්‍රයේ සඳහන් දිනයට පමණි.

08. මෙම අවසර පත්‍රය අන්සතු කිරීම සම්පූර්ණයෙන් තහනම්වේ.එසේ අන්සතු කිරීම හෝ ඔබ සංචාරක නිවාසයේ ගත කරන කාලය තුළ ඔබට විරුද්ධව යම් පැමිණිල්ලක් ලැබුණහොත් හෝ අයදුම්කරුට එරෙහිව විනයානුකූලව ක්‍රියාකරනු ලැබේ.

09. සංචාරක බංගලාවේ කාමර කුලියට අමතරව නවාතැන් ගන්නා අය වෙනුවෙන් සපයනු ලබන ඇඳ ඇතිරිලි සහ කොට්ට උර ආදිය සඳහා පහත පරිදි ගාස්තු ගෙවිය යුතු වේ.එම ගෙවීම් වෙනුවෙන් අදාල බංගලා භාරකරු වෙතින් මුදල් ලදුපතක් ලබා ගත යුතු ය.

| | | |
|---|---|---|
| ඇඳ ඇතිරිල්ලකට | - | රු.100.00 |
| කොට්ට උරයකට | - | රු.50.00 |
| පොරවන | - | රු.100.00 |
| තුවා | - | රු.75.00 |

10. ආහාර පාන සැකසීම සඳහා වියදම් බංගලා භාරකරු විසින් වෙනම අයකරනු ලැබේ.(ගෑස් සඳහා 05 දෙනෙකුට නොවැඩි - වේලකට රු.200.00 සහ 05 දෙනෙකුට වැඩි - වේලකට රු.400.00 ) සංචාරක නිවාසයෙන් බැහැර වීමට ප්‍රථම සියලුම මුදල් ගෙවා නිරවුල් කළ යුතු ය.

11. සංචාරක බංගලාවේ ඇති රූපවාහිනිය,ගුවන්විදුලිය,දුරකථනය හා අනෙකුත් භාණ්ඩ බංගලා භාරකරුගේ අවසරයකින් තොරව පරිහරණය කිරීම සම්පූර්ණයෙන් තහනම් වේ.

12. සංචාරක බංගලා පරිහරණය කිරීමේදී එහි ඇති භාණ්ඩ වලට අලාභ හානි සිදු වුවහොත් එකී වටිනාකම අයදුම්කරුගෙන් අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

13. නවාතැන් පහසුකම් පිළිබඳ පැමිණිලි ඇතහොත් දෙපාර්තමේන්තුව වෙත දැන්විය හැක.

කාර්යාලය - 011-2348896, 011-2348897, 011-2439078

මෙම උපදෙස් නිසියාකාරව ක්‍රියාත්මක කරන අතර,මේ අනුව කටයුතු කිරීමෙන් ඔබ දක්වන සහයෝගයට කෘතඥවෙමි.

**අධ්‍යක්ෂ ජනරාල්**